1727


# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර
## மாவட்ட செயலகம் - அநுராதபுரம
## District Secretariat - Anuradhapura

Fax : 025 - 2222235 E-mail :- dissecanu@sltnet.lk

| | දිස්ත්‍රික් ලේකම් மாவட்ட செயலர் District Secretary | අතිරේක දිස්ත්‍රික් ලේකම් மேலதிக மாவட்டசெயலாளர் Addi.District Secretary | සහකාර දිස්ත්‍රික් ලේකම් உதவட்ட செயலாளர் Asst.District Secretary | ප්‍රධාන ගණකාධිකාරී பிரதான கணக்காளர் Chief Accountant | පරිපාලන නිලධාරී நிர்வாக உத்தியோகத்தர் Admin Officer |
|---|---|---|---|---|---|
| කාර්යාලය அலுவலகம் Office | 025 - 2235479<br>025 - 2222235 | 025 - 2235048 | 025 - 2222236 | 025 - 2222706<br>53299 | 025 - 2222237<br>025 - 2235537 |
| නිවස/வதி/Res. | 025 - 2222205 | 025 - 2223833 | | | |


මගේ අංකය எனது இல My No: ANU/AGS/18/01/02/ වාහල්කඩ

ඔබේ අංකය உமது இல Your No:

දිනය திகதி Date : 2020.06.10

23 JUN 2020

අධ්‍යක්ෂ ( වාරි කළමණාකරණ )

වාරි කළමණාකරන අංශය,

තැ.පෙ.1702

වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,

බෞද්ධාලෝක මාවත,

කොළඹ 07

<u>මහ වාරිමාර්ග ව්‍යාපාර කන්න රැස්වීම් තීරණ ගැසට් පත්‍රයේ පල කිරීම</u>

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් මහා වාරි ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා පැවැත්වූ වගා කන්න රැස්වීම් තීරණ ඔබ වෙත යොමු කරමි.

02. මෙම තීරණ ගැසට් පත්‍රයේ පළ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

I. වාහල්කඩ මහා වාරිමාර්ග ව්‍යාපාරය

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර

ආර්.එම්. වන්නිනායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.

පිටපත්

1. කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ , කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර- කා.දැ.පි / අ.ක.ස
2. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කැබිතිගොල්ලෑව - කා.දැ.පි / අ.ක.ස
3. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හොරොව්පොතාන - කා.දැ.පි / අ.ක.ස
4. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, පදවිය - කා.දැ.පි / අ.ක.ස
5. නේවාසික ව්‍යාපාර කළමණාකරු, වාහල්කඩ ව්‍යාපාරය - කා.දැ.පි / අ.ක.ස

# ආණ්ඩුවේ නිවේදන

## කන්න රැස්වීම් තීරණ ප්‍රකාශයට පත් කිරීම

වාහල්කඩ මහා වාරිමාර්ග ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග ( සංශෝධන ) පනත යටතේ පිහිටුවන ලද වාහල්කඩ මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා **"විශේෂ ව්‍යාපාර කළමණාකරණ කමිටු වගා රැස්වීම"** 2020.04.09 දින වාහල්කඩ, ව්‍යාපාර කළමණාකරන කාර්යාලයේදී පැවැත්වූ අතර එහිදී 2020 යල කන්නයේ වගා කටයුතු සඳහා පහත සහන් වගා කාලසටහන හා යෝජනා සම්මත කරන ලදී.

2020 යල කන්නයේ වගා කාල සටහන

| අනු අංකය | කාරණය | විස්තරය |
|---|---|---|
| 01 | වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය ( අක්කර ) | වී අක්කර 1500, අතිරේක බෝග අක්කර 500 |
| 02 | වගා කිරීමට යෝජිත ප්‍රදේශය | මුළු ව්‍යාපාරයම |
| 03 | වගා කිරීමට යෝජිත බෝග වර්ග | වී මාස 2 ½ , 3 හා අතිරේක බෝග |
| 04 | ගොවීන් විසින් ඇලවේලි නඩත්තු කර අවසන් කළ යුතු දිනය | 2020.04.15 |
| 05 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇළ සහ බෙදුම් ඇළවල් දිය බස්නා ඇළවල් නඩත්තු කර අවසන් කළ යුතු දිනය | 2020.04.18 |
| 06 | ගොවීන් විසින් නියමිත දිනට නඩත්තු නොකරන ලද ඇලවේලි ගොවි සංවිධාන විසින් නඩත්තු කර අවසන් කළ යුතු දිනය | 2020.04.18 |
| 07 | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.04.23 |
| 08 | ට්‍රැක්ටර් යායෙන් ඉවත් කළ යුතු අවසාන දිනය | 2020.05.10 |
| 09 | වී වපුරා හෝ පැල සිටුවා අවසන් කළ යුතු දිනය | 2020.05.15 |
| 10 | මුර ජලය ආරම්භ වන දිනය | 2020.05.13 |
| 11 | අවසන් වරට ජලය නිකුත් කරන දිනය | 2020.07.25 |
| 12 | වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2020.05.10 |
| 13 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2020.08.25 |
| 14 | අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය | 2020.08.25 |
| 15 | ඇලවේලි ශුද්ධ නොකිරීමේ දඩය බඹයකට | රු.200.00 |
| 16 | සංවර්ධන මුදල් අය කිරීම අක්කරයකට | රු.200.00 |
| 17 | නිර්මිත හානි දඩය | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව |

**සම්මත වූ අනෙකුත් නීති හා රෙගුලාසි**

1. සියළුම ගොවි මහතුන් තම කුඹුරෙන් අක්කර 1.5 ක් වී ද අක්කර 0.5 ක් අතිරේක භෝග ද වගා කළ යුතුය. අතිරේක බෝග වගා නොකරන ගොවීන් සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.
2. ඇලවේලි / නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංගවලට හානි කරන පුද්ගලයන් නීතිය හමුවට පැමිනවීම වාරිමාර්ග ආඥා පනතේ 23 වෙනි වගන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලය පවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වෙනි වගන්තිය අනුව වැරදිකරුවන් දඬුවමට ලක්වනු ඇත.
3. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ ද්‍රව්‍ය එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 84 ( 1 ) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධානයේ නියෝජිතයින් හට බලය පවරා ඇත.
4. මෙම කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරන ගොවි නියෝජිතයින් හෝ ජල පාලකවරුන් රාජකාරියෙහි නියැලෙන විට බාධා කිරීමක් , ඉඩ නොදීමක් , පරිභව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම , රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරුවේ. ( ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වැනි වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 72 වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණ සළසා ඇත.
5. අනපේක්ෂිත ලෙස අයහපත් කාළගුණික තත්වයක් හෝ කිසියම් පාලනය කරගත නොහැකි බාහිර උපද්‍රවයක් ඇති වූ විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපෘති කළමණාකරන කමිටුව සතුය.
6. මෙම නිවේදනයේ යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපන බලය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් සතුය.

ආර්.එම්.වන්නිනායක,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර දිස්ත්‍රික්කය

ආර්.එම්. වන්නිනායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.